**ත්‍රිකුණාමලය නගර සභාව**

**-------------------------------------**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------------**

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මාස 06 ක ප්‍රමාදයකින් පසුව 2016 සැප්තැම්බර් 05 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 14 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ත්‍රිකුණාමලය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**----------------------------**

ගිණුම් පිළියෙල කිරීම සඳහා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

**-------------------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව, ලැබිය යුතු නිල නිවාස කුලී ශේෂය රු.482,642 ක් විය. කෙසේ වුවද, 2016 වර්ෂය තුළදී එම ශේෂය රු.461,807 ක් ලෙස ඉදිරියට ගෙනැවිත් තිබුණි. එබැවින් ලැබිය යුතු කුලී ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.20,835 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා රු.733,333 ක් වූ ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු රු.11,442,929 ක් වූ ලැබිය යුතු වරිපනම් බදු ශේෂ පත්‍රයේ ලැබිය යුතු ලෙස දක්වා තිබුණද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එය ආදායම ලෙස දක්වා නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ආදායම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට සිදුකරන භාණ්ඩ සමීක්ෂණයට අනුව, එම දිනට පොදු ගබඩා විෂයයන්හි මුළු වටිනාකම රු.10,945,878 ක් ලෙස විය. කෙසේ වුවද, එය රු.5,495,204 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින් පොදු ගබඩා විෂයයන්හි වටිනාකම රු.5,450,674 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) දැවීමේ උපකරණයක් (Incinerator) මිලදී ගැනීම සඳහා සභාව විසින් 2015 වර්ෂයේදී රු.2,705,000 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද එම උපකරණයේ පිරිවැය ලෙස මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු.1,352,500 ක මුදලක් පමණක් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මුළු පිරිවැය වටිනාකම රු.1,352,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) රු.16,887,724 ක මුළු පිරිවැයකට සභාව විසින් ඉදිකරන ලද ශ්‍රවණාගාරය හා ඉන්ධනහල යනාදී ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(උ) වෙළඳපොල සංකීර්ණය, සායන මධ්‍යස්ථානය හා ගිනි නිවීම් ඒකකය වැනි ගොඩනැගිලි ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සභාව විසින් පවත්වාගෙන යන ලේඛනවලට අනුව, හිඟ උත්සව අත්තිකාරම් හා පොත් අත්තිකාරම් ශේෂ පිළිවෙලින් රු.84,250 ක් හා රු.6,750 ක් විය. කෙසේ වුවද, එම ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවල රු.91,750 ක් හා රු.10,750 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, උත්සව අත්තිකාරම් හා පොත් අත්තිකාරම් ශේෂ රු.11,500 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) 2016 දෙසැම්බර් 31 දිනට රු.3,239,972 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

**------------------------**

නිරවුල් කිරීමට කටයුතු කිරීමකින් තොරව රු.11,863,654 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**----------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.6,161,644 ක් වූ හඳුනා නොගත් ශේෂ 2003 වර්ෂයේ සිට පරිශේෂව පැවතුණි. කෙසේ වුවද, එම ශේෂ අයකරගැනීමට හෝ ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු.4,545,638 ක් වූ හඳුනා නොගත් බැර ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-------------------------------------**

මුළු එකතුව රු.28,376,583 ක් වූ ගිණුම් විෂයයන් 13 ක් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ කිහිපයක සිට මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩව දක්වා තිබුණි. කෙසේ වුවද, එම විෂයයන් පිළිබඳ පැවැත්ම තහවුරු කර ගැනීමට කිසිදු ලිඛිත සාක්ෂියක් නොමැති වීම හේතුවෙන් එම විෂයයන් සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.474,076 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් වර්ෂ 03කට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 1646 | සභාව සතු මෝටර් වාහන 38 කට අදාළව මාසික සාරාංශ පවත්වා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | මෝටර් වාහනවල ඉන්ධන පරිභෝජනය මාස 06 කට වරක් පරීක්ෂා කළ යුතු වුවද, සභාව සතු මෝටර් වාහන 38 ක් සම්බන්ධයෙන් එසේ පරීක්ෂා කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,437,984 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,061,043 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.20,623,059 ක පිරිහීමක් දැක්වුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම**

(අ) ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් බදු | 39,555 | 34,788 | 98,369 |
| (ii) | බදු කුලී | 17,171 | 22,779 | 19,404 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,720 | 4,250 | නැත |
| (iv) | වෙනත් ආදායම් | 22,821 | 11,620 | 431 |

(ආ) අධිකරණය නියෝගය අනුව, හිඟ සාප්පු කුලී අයකර ගැනීම් ලෙස බදුකරුවන්ගෙන් 2016 වර්ෂය තුළදී රු.4,118,295 ක මුළු මුදලක් ලැබී තිබූ අතර මුළු හිඟ මුදලින් මෙම මුළු අයකර ගැනීමම අඩුකර ගෙන තිබුණි. කෙසේ වුවද, එක් එක් බදුකරුගෙන් අයකරගත් බදු ප්‍රමාණය හඳුනාගැනීමට හා අදාළ බදුකරුගේ හිඟ මුදල් ප්‍රමාණය අඩුකිරීමට කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අය විය යුතු මුදල දැනටමත් නිරවුල් කර තිබුණද එක් එක් බදුකරු සඳහා හිඟ බදු මුදලක් ඉදිරියට ගෙනැවිත් තිබුණි.

### 2.2.2 හිඟ කුලී ආදායම

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාව සතු නිල නිවාසවල පදිංචි වී සිටි නිලධාරීන් 34 දෙනෙකු වර්ෂ කිහිපයක සිට නිවාස කුලී ගෙවා නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.429,432 ක් වූ මුදලක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද, එම හිඟ කුලී අයකර ගැනීම සඳහා විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ආ) අනුරාධපුර හන්දියේ ලිංගානගර්හි හා මධ්‍යම බස් නැවතුම්පොළේ පිහිටි කඩ කාමර 300 ක් නගර සභාව විසින් කුලියට දී තිබුණි. කෙසේ වුවද, කඩ කාමර 268 කින් එකතුව රු.14,200,543 ක් වූ කුලී අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 08 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 සහ 2016 වර්ෂ සඳහා වූ උසාවි දඩ හා මුද්දර ගාස්තු මුළු මුදල හඳුනා ගැනීමට හා එම මුදල් නැගෙනහිර පළාතේ, පළාත් භාණ්ඩාගාරයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අදාළ පාර්ශවයන් සමඟ ගිවිසුම් වලට එළඹීමෙන් තොරව නිල නිවාස 6 ක් නගර සභාව විසින් 2005 වර්ෂයේ සිට පුද්ගලික පාර්ශවයන්ට කුලියට ලබාදී තිබුණි. කෙසේ වුවද, හිඟ කුලී මුදල අයකර ගැනීමට සභාව විසින් මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) ලංකා බැංකුවේ පවත්වාගෙන යන ලද ජංගම ගිණුමක් වර්ෂ 5 කට පෙර සිට අක්‍රීය ගිණුමක් ලෙස පැවතුණු නමුත් මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොතිබුණි.

(ඈ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය විසින් පරිත්‍යාග කරන ලද මෝටර් වාහන 09 ක අයිතිය පවරා ගැනීම සඳහා වර්ෂ 5 කට වැඩි කාලයක් කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නගර සභාවට අයත් කඩ සාප්පු 299 කින්, සාප්පු 90 ක් 2011 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද, මෙම සාප්පු කුලියට දීම සඳහා සභාව විසින් මෙතෙක් පියවර ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස දළ වශයෙන් රු.2,000,000 ක වාර්ෂික ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ කුලියට ලබාදී ඇති කඩ සාප්පු 21 කින් අයවිය යුතු රු.1,330,104 ක කුලී මුදල්වලින් කිසිදු මුදලක් සභාව විසින් අයකරගෙන නොතිබුණි.

(ඇ) නගර සභා ආඥාපනතේ 164 (2) වගන්තිය අනුව, සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන සංචාරක හෝටල්වල මුළු ආදායම පදනම් කරගෙන එම හෝටල්වලින් බදු අයකළ යුතුය. කෙසේ වුවද, සභාව විසින් සංචාරක හෝටලයකින් 2016 වර්ෂය සඳහා බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------------

### 3.3.1 නයිට් සොයිල් ට්‍රීට්මන්ට් ප්ලාන්ට් (Night Soil Treatment Plant) ඉදිකිරිම

-----------------------------------------------------------------------------

රු.6,401,355 ක කොන්ත්‍රාත් වටිනාකමට නයිට් සොයිල් ට්‍රීට්මන්ට් ප්ලාන්ට් ඉදිකිරීම සඳහා 2012 ජනවාරි 28 දින සභාව විසින් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බිල්පත්‍ර සඳහා රු.4,485,156 ක් වූ මුදලක් ලබාගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් වැඩ අත්හැර දමා තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගත කිරීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) ඉහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරු විසින් වැඩ අතරමඟදී නතර කර තිබුණද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් ඉංජිනේරු විසින් සම්පූර්ණ ඉදිකිරීම් වැඩ සතුටුදායක ලෙස නිමකළ බවට 2014 නොවැම්බර් 20 දිනැති ඔහුගේ ලිපියෙන් සහතික කර තිබුණි. ඒ අනුව, සභාව විසින් කොන්ත්‍රාත්කරුට රු.304,491 ක් වූ රඳවා ගැනීම් මුදල් මුදාහැර තිබුණි.

(ඇ) විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමෙන් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරිම හේතුවෙන් මෙම ඉදිකිරීම් වැඩවලට අදාළව වැයකරන ලද මුදල ඵල රහිත වියදමක් බවට පත් වී තිබුණි.

### 3.3.2 විදුලි වැට ඉදිකිරිම

--------------------

සභාව විසින් ඝන අපද්‍රව්‍ය ගොඩගැසීම සඳහා වෙන්කරන ලද ඉඩම වටා විදුලි වැටක් ඉදිකිරීමට 2014 ජුනි 20 දින රු.893,060 ක කොන්ත්‍රාත් වටිනාකමට පළාත් පාලන කොමසාරිස් විසින් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවිතරයන් හා සැලසුම් අනුව, වැට ඉදිකිරීම සඳහා සවිකරන ලද ලී කණු 2 ක් අතර පරතරය මීටර් 4 ක් විය යුතුය. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු විසින් ලී කණු අතර පරතරය මීටර් 33 ක් ලෙසින් සවිකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විදුලි වැට සඳහා සවිකරන ලද තෙකලා විදුලි කම්බි එකිනෙකට ගැටී තිබුණි.

(ආ) විදුලි වැට සඳහා විදුලි බලය නොසැපයීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් සවිකරන ලද ලී කණු සවි කරන ලද දිනයේ සිටම වල් අලින් විසින් හානිකර තිබුණි.

(ඇ) 2015 ඔක්තෝබර් 15 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී ලී කණු, කම්බි ආදී විදුලි වැට ඉදිකිරීම සඳහා යොදාගත් සියලු විෂයයන් නාඳුනන පුද්ගලයන් විසින් ඉවත් කර ගෙන තිබුණු බව නිරික්ෂණය විය. එබැවින්, මෙම කාර්යයන් සඳහා වැයකරන ලද රු.618,858 ක් වූ මුළු මුදල නිෂ්ඵල වියදමක් බවට පත්වී තිබුණි.

## 3.4 පාරිසරික ගැටලු

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත ප්‍රකාරව, ඉන්ධන පිරවුම් හල්, සිමෙන්ති වැඩ, වඩුවැඩ, ගරාජ් හා වීමෝල් පවත්වාගෙන යන ව්‍යවසායකයින් විසින් නගර සභාවෙන් පාරිසරික බලපත්‍ර ලබා ගත යුතුය. කෙසේ වුවද, ව්‍යාවසායන් විසින් එබඳු බලපත්‍ර ලබාගැනීමෙන් තොරව ඉහත සඳහන් ව්‍යාපාරයන් පවත්වා තිබුණි.

# 4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

## 4.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම හා වියදම සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 16 සිට 52 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.2 වත්කම් කළමනාකරණය

### 4.2.1. නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

සභාවට අයත් මෝටර් වාහන 15 ක් අලුත්වැඩියා කිරිමට හෝ අපහරණය කිරීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 01 සිට 08 දක්වා වූ කාල පරිච්ඡේදයක් කාර්යාල පරිශ්‍රයේ නිෂ්කාර්යව පැවතුණි.

### 4.2.2 සමීක්ෂණ මණ්ඩල කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 වර්ෂයේදී පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව, විෂයයන් 222 ක් වෙන්දේසියකින් විකිණීමට, භාණ්ඩ විෂයයන් හා පුස්තකාල පොත් 203 ක් අපහරණය කිරීමට සහ භාණ්ඩ විෂයයන් හා පුස්තකාල පොත් 430 ක් අලුත්වැඩියා කිරිමට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, එම නිර්දේශ 2017 ජුනි 13 දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) 2015 වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේදී පුස්තකාල පොත් 1652 ක ඌනතාවයන් අනාවරණය විය. කෙසේ වුවද, පුස්තකාල පොත් ඌනතාවය සඳහා වගකිව යුතු නිලධාරියාට එරෙහිව කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව, 2016 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයන් සිදුකළ යුතුය. කෙසේ වුවද, නගර සභාව විසින් 2017 ජුනි 13 දක්වා භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි.

## 4.3 පිළිතුරු නොලත් විගණන විමසුම්

2016 වර්ෂයේදී නිකුත් කරන ලද විගණන විමසුම් 2 කට පිළිතුරු සැපයීමට නගර සභාව විසින් කටයුතු කර නොතිබුණි. එම විගණන විමසුම්වල ඇතුළත් ගනුදෙනුවල මුළු වටිනාකම රු.6,733,227 ක් විය.

**4.4 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ ගණකාධිකාරී තනතුර වර්ෂ 11 කට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද, එම තනතුර සඳහා නිලධාරියකු ස්ථිරව පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සෞඛ්‍ය අධීක්ෂක, සෞඛ්‍ය සේවිකාවන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක, පරිවර්තක, කාර්මික නිලධාරීන්, වෙළඳපොල අධීක්ෂක, මෝටර් මැන් සහ ෆයර් මැන් යන තනතුරු 2017 ජුනි 13 ක් වූ විගණිත දිනය දක්වා පුරප්පාඩු වී පැවතුණි.

**5. පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| **පද්ධතිය** | අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍රය |
|---|---|
| (අ)ගිණුම්කරණය | අවිධිමත්ව ලෙජරය පවත්වා ගැනීම හා ජංගම නොවන වත්කම් හා ආදායම වාර්තා කිරීම. |
| (ආ)අයවැය ලේඛනමය පාලනය | ආදායම හා වියදම පුරෝකථනය කිරීමෙන් තොරව අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම. |
| (ආ)දායම් පරිපාලනය | හිඟ ආදායම එකතු කිරීම පිළිබඳ දිගු ප්‍රමාදයන් |
| (ඇ)මානව සම්පත් කළමනාකරණය | ප්‍රධාන තනතුරු පුරප්පාඩු පිරවීම පිළිබඳ දිගු ප්‍රමාදයන් |
| (ඉ)කොන්ත්‍රාත් පරිපාලනය | ඉදිකිරීම වැඩ අත්හරින ලද කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව කටයුතු නොකිරීම. |